# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

## පුරප්පාඩු දැන්වීමයි

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්කිරීම සඳහා පහත දක්වා ඇති සුදුසුකම්ලත් වෘත්තිකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| **තනතුරු නාමය** | පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් |
| **සේවා කාලය** | පත්වීම් දින සිට වසර දෙකක් (02) දක්වා |
| **වැටුප් පරිමාණය** | 88,000-12X2,700 - 120,400=<br>(රා. ප. චක්‍රලේඛ අංක 3 /2016 - SL 03-2016 අනුව) |
| **වයස් සීමාව** | අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. |

**අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්**

01 (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරාවිද්‍යා (විශේෂවේදී)/ උරුම කළමනාකරණය ප්‍රථම උපාධිය සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක හෝ විශ්වවිද්‍යාලයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර විස්සක (20) පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සේවය කර තිබීම

හෝ

(ආ) ඉහත විෂයන්ගෙන් ලබා ගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම හා ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) විශිෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියකු වශයෙන් පළපුරුද්දක් තිබීම.

02. සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

03. අයදුම්කරුවන් තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට හැකි වන ලෙස මනා කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

04. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

- ඉදිරිපත් වන අයදුම්කරුවන් අතුරින් සුදුසු අයකු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

**වෙනත් :**

- තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාළව අනුමත කර ඇති දීමනා හා වරප්‍රසාද තනතුර දරන කාලසීමාවට අදාළව හිමි වේ.
- රජයේ, රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ විශ්වවිද්‍යාලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් සමග තනතුරට තෝරා ගතහොත් නිත්‍ය තනතුරින් නිදහස් කරන බවට තම ආයතන ප්‍රධානීගේ එකගතාව ඇතුළත් ලිපියක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

මේ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂය පළ කරන අයදුම්කරුවන් තමා විසින්ම සකස් කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් තමාගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පිටපත් ද සමග 2023.12.12 දිනට පෙර ලැබෙන ලෙසට **"ලේකම්, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, අංක 135, අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය" ලෙස සඳහන් කළ යුතුය.

**ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,**
**අංක 135, අනගාරික ධර්මපාල මාවත,**
**කොළඹ 07.**